**ශීර්ෂය 212 - විභාග දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

විභාග දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විභාග දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට විභාග දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට හා තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තත්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබලවන්නේ දූස්සන්ධානය , ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තා

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශයන් ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි හා භාණ්ඩාගාර පොත්වල සඳහන් දෙපාර්තමේන්තු වත්කම් වටිනාකම අතර රු.2,924,239,024 ක වෙනසක් නිරීක්ෂණය විය. | වර්ෂය අවසානයේදී භාණ්ඩාගාරයේ වාර්තා වල සඳහන් වත්කම් වටිනාකම දෙපාර්තමේන්තුවේ ගිණුම් වල සඳහන් වත්කම් වටිනාකම සමඟ සැසඳෙන බව තහවුරු කරගත යුතුය. | එකඟවන බවත් ඉදිරියේදී නිවැරදි කරන බවත් |

### 1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 396 (ඇ) මුදල් රෙගුලාසි | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ක් ඉක්මවූ රු. 256,153 ක් වටිනා චෙක්පත් 80 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | එකඟ වන බවත් නිවැරදි කිරීමට සටහන් කර ගන්නා බවත් |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| | (i) 2.8.2 වගන්තිය | මාර්ගෝපදේශයන්ට පටහැනිව ටරින් කී මුද්‍රණ යන්ත්‍රය මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් 05 දෙනෙකු විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිර්දේශ කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | මෙම යන්ත්‍රය මිලදී ගැනීමේ අවශ්‍යතාවය දෙපාර්තමේන්තුව සතු වූ බැවින් විභාග කොමසාරිස් ජනරාල් විසින් තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් නිර්දේශ කර යැවූ බව |

| | | | |
|---|---|---|---|
| (ii) 8.9.3 වගන්තිය | රු.මිලියන 500 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් ගිවිසුම් රේඛීය අමාත්‍යාංශ ලේකම් අත්සන් කල යුතු වුවද රු. 546,264,452 ක් වූ වර්න් කී මුද්‍රණ යන්ත්‍රය මිලදී ගැනීමේ කොන්ත්‍රාත් ගිවිසුම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් අත්සන් කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | එකඟ වන බවත් අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් පරිදි ගිවිසුම අත්සන් කල බව |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

## 2.1 වියදම් කළමනාකරණය

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන නිශ්චිත සැලැස්මක් අනුව වාර්ෂික ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා වැය විෂයයන් 11 ක සියයට 15 සිට සියයට 77 දක්වා පරාසයක රු.360,701,420 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු සකස් කල යුතුය. | එකඟ වන බව |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වැඩ තහනමට ලක් වූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වසර 5 ඉක්ම වූ රු.473,367 ක ණය ශේෂයක් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ජේදයේ 4 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය. | එකඟවන බවත් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත් |
| (ආ) 1995 සිට 2008 දක්වා කාලය තුල දී සේවය හැර ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අය විය යුතු රු.113,351 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර ගැනීමට නොහැකි වී තිබුණි. | ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ජේදයේ 4 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය. | එකඟවන බවත් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත් |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 සැලසුම් කිරීම

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලසුම් ප්‍රකාරව ඉටු කිරීමට අපේක්ෂිත වූ 1990 වර්ෂයට පෙර නිකුත් කල අ.පො.ස සාමාන්‍ය පෙළ සහ අ.පො.ස උසස් පෙළ විභාග සහතික ස්කෑන් කිරීම 2020 ජනවාරි 31 වන විටත් ආරම්භ කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම අනුව කටයුතු කල යුතුය. | ප්‍රතිඵල ලේඛන ස්කෑන් කිරීමේ කටයුතු නිම කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇති බව |

### 3.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 1976 අංක 17 දරන පනතෙන් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ දේශිය හා විදේශිය පෞද්ගලික විභාග සංවිධානය කිරීම සඳහා ප්‍රතිපාදන නොමැති වුවද දෙපාර්තමේන්තුව ආරම්භයේ සිටම දේශිය හා විදේශිය පෞද්ගලික විභාග සංවිධානය හා පැවැත්වීමේ පූර්වාදර්ශය අනුගමනය කරමින් වාර්ෂිකව එම විභාග සංවිධානය කර පවත්වා තිබුණි. | විභාග පැවැත්වීම අත්හිටුවීමට වඩා මෙම විභාග සංවිධානය කිරීම හා පැවැත්වීම සඳහා අවශ්‍ය නිතීමය ප්‍රතිපාදන සලසා ගැනීම යෝග්‍ය බව | විභාග දෙපාර්තමේන්තුව ආරම්භයේ සිටම පෞද්ගලික හා විදේශ විභාග පවත්වා ඇති අතර එම පූර්වාදර්ශ අනුගමනය කරමින් මේ දක්වා එම විභාග සංවිධානය කර පවත්වා ඇති බවත් එසේ පැවැත්වීමට නීතිමය ප්‍රතිපාදන නොමැති නම් මින් ඉදිරියට එම විභාග පැවැත්වීම අත්හිටුවීමට කටයුතු කරනු ලබන බව |
| (ආ) දෙපාර්තමේන්තුව වාර්ෂිකව පවත්වන දේශිය හා විදේශිය පෞද්ගලික විභාග සංවිධානයේ සිට ප්‍රතිඵල නිකුත් කිරීමේ කාර්ය සඳහා පෞද්ගලික ආයතන හා දෙපාර්තමේන්තුව අතර ගිවිසුම් ඇති කරගෙන නොතිබුණි. | මේ සඳහා පෞද්ගලික ආයතන සමඟ ගිවිසුම් ඇති කර ගත යුතුය. | 2019 වර්ෂයට පෙර වර්ෂයන්හිදී, දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව පවත්වනු ලබන එම විභාග සඳහා පෞද්ගලික ආයතන හා දෙපාර්තමේන්තුව අතර ගිවිසුම් අත්සන් කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මකවී නොතිබුණු බවත් මේ වනවිට විභාග සම්බන්ධයෙන් ගිවිසුම් ගතවීම ආරම්භ කර ඇති බවත් |

| | | |
|---|---|---|
| (ඇ) පෞද්ගලික හා විදේශ විභාග පැවැත්වීම වෙනුවෙන් 2017 ,2018 සහ 2019 වර්ෂ සඳහා රු. 7,305,345 ක් රජය විසින් දරා තිබුණ ද එම මුදල් පෞද්ගලික ආයතන වලින් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | පෞද්ගලික හා විදේශ විභාග සඳහා දරන වියදම් විධිමත් පරිදි අයකර ගැනීමට කටයුතු කල යුතුය. | එකඟ වන බවත් අදාළ නිලධාරීන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බවත් |

## 3.3 ප්‍රසම්පාදනය

---------------

**ප්‍රශ්න පත්‍ර මුද්‍රණය සඳහා ඩිජිටල් ටර්න් කී මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේදී රුපියල් 546,264,402 ක් වටිනා මෙම යන්ත්‍රය මිලදී ගැනීමට පෙර එහි යෝග්‍යතාවය හා යන්ත්‍රය නඩත්තු කිරීමට දෙපාර්තමේන්තුවේ ඇති ධාරිතාවය පිළිබඳව ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබුණි. | අධික පරිවැයක් සහිත මෙවැනි යන්ත්‍ර මිලදී ගැනීමට පෙර එහි යෝග්‍යතාවය පිළිබඳව ශක්‍යතා අධ්‍යනයක් සිදු කල යුතුය. | දෙපාර්තමේන්තුවේ පවතින පැරණි මුද්‍රණ යන්ත්‍ර ප්‍රශ්න පත්‍ර මුද්‍රණය සඳහා භාවිතා කිරීම හේතුවෙන් මතු වී ඇති අපහසුතා දක්වමින් නව යන්ත්‍රයක් මිලදී ගැනීමේ අවශ්‍යතාවය තහවුරු කර මින් ශක්‍යතා අධ්‍යනයක් සිදු කර ඇති බව |
| (ආ) මුද්‍රණ යන්ත්‍රයේ පැයක ධාරිතාවය පොත් කට්ටල 4000 ක් වු නමුත් 2018 හා 2019 වර්ෂ වලදී පිළිවෙලින් පොත් කට්ටල 135,300 ක් හා 383,750 ක් පමණක් මුද්‍රණය කර තිබුණි. එසේම A3 , A4 ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීමේ පැයක ධාරිතාවය ප්‍රශ්න පත්‍ර 13,000 ක් වු නමුත් 2018 හා 2019 වර්ෂ වලදී A3 , A4 ප්‍රශ්න පත්‍ර 160,500 ක් හා 212,000 ක් පමණක් මුද්‍රණය කර තිබුණි. ඒ අනුව 2018 හා 2019 වර්ෂවලදී පොත් මුද්‍රණය සඳහා සහ A3 , A4 ප්‍රශ්න පත්‍ර මුද්‍රණය සඳහා උපයෝජනය කල කාලය පිළිවෙලින් පැය 34 ක් හා පැය 96 ක් සහ පැය 12 ක් හා පැය 16 ක් පමණක් විය. | යන්ත්‍රයේ ධාරිතාවය කාර්යක්ෂම ලෙස උපයෝජනය කල යුතුය. | යන්ත්‍රයේ පිරිවිතර වලට අනුව ගැලපෙන කඩදාසි දේශීයව සපයා ගැනීමට නොහැකි වීම නිසා කඩදාසි ආනයනය කිරීමට සිදු වු බවත් ආනයනයේදී ඇති වු දුෂ්කරතා නිසා කඩදාසි සපයා ගැනීම ප්‍රමාද වු බවත් ඒ හේතුවෙන් උපයෝජනය ප්‍රමාද වු බව |
| (ඇ) අවුරුද්දක් වැනි කෙටි කාලයකින් | යන්ත්‍රයේ ධාරිතාවය | සියයට 8 කට ආසන්න |

| | | |
|---|---|---|
| වගකීම් කාලය අවසන් වන ලෙස ප්‍රශ්න පත්‍ර මුද්‍රණය සඳහා 2018 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු ඉහත මුද්‍රණ යන්ත්‍රයෙන් 2019 වර්ෂයට අදාල අ.පො.ස සාමාන්‍ය පෙළ ප්‍රශ්න පත්‍ර වලින් සියයට 08 ක් පමණක් මුද්‍රණය කර තිබුණු අතර දෙපාර්තමේන්තුව සතු පැරණි යන්ත්‍ර 08 කින් අ.පො.ස. උසස් පෙළ සහ ශිෂ්‍යත්ව ප්‍රශ්න පත්‍ර වලින් සියයට 100 ක් ද සාමාන්‍ය පෙළ ප්‍රශ්න පත්‍ර වලින් සියයට 92 ක් ද මුද්‍රණය කර තිබුණි. ඒ හේතුවෙන් 2019 වර්ෂයේදී යන්ත්‍රය වෙනුවෙන් මිලදී ගත් රු.26,208,600 ක් වටිනා අමුද්‍රව්‍ය වලින් රු.22,217,630 ක් වටිනා අමුද්‍රව්‍ය භාවිතයට නොගෙන ඉතිරි වී තිබුණි. | කාර්යක්ෂම ලෙස උපයෝජනය කල යුතු අතර උපයෝජනය කරන ධාරිතාවය අනුව අමුද්‍රව්‍ය මිලදී ගැනීමටත් අවශ්‍ය ප්‍රමාණයට පමණක් අමුද්‍රව්‍ය තොග තබා ගැනීමටත් සැලකිලිමත් විය යුතුය. | ප්‍රමාණයක් මුද්‍රණය කර ඇති බවත් අපේක්ෂිත මුද්‍රණ ප්‍රමාණය සිදු කිරීමට නොහැකි වූ නිසා පුරෝකථනය කරන ලද අමුද්‍රව්‍ය ප්‍රමාණය භාවිතයට ගැනීම සිදු නොවූ බව හා ඉදිරි මුද්‍රණ කටයුතු සඳහා එම ද්‍රව්‍ය භාවිත කරන බව |
| (ඇ) යන්ත්‍රයේ උපරිම ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීමකින් තොරව වාර්ෂිකව නඩත්තු හා මෘදුකාංග බලපත්‍ර ගාස්තු ලෙස රු.9,660,000 ක් දෙපාර්තමේන්තුව විසින් දරා තිබුණි. | යන්ත්‍රයේ උපරිම ධාරිතාවය කාර්යක්ෂම ලෙස උපයෝජනය කල යුතුය. | ගිවිසුම් ප්‍රකාරව මෙම මුදල ගෙවිය යුතු බවත් ඉදිරියේදී සැපයුම්කරු විසින් පුහුණුවක් ලබා දීමෙන් පසුව ස්ථිර කාර්ය මණ්ඩලයක් සහිතව මෙම යන්ත්‍රය ප්‍රධාන විභාග සඳහා භාවිතයට ගැනීමට අපේක්ෂිත බව |
| (ඉ) පිරිවිතර අංක 9 (ඇ) වගන්තිය සහ සැපයුම්කරුගේ ලංසු ලියවිලි අනුව සැපයුම්කරුගේ වියදමින් නිලධාරීන් 04 දෙනෙකුට විදේශ පුහුණුවක් ලබා දිය යුතු වුව ද යන්ත්‍රය සවි කර වර්ෂයක් ගත වුව ද එසේ සිදුකර නොතිබුණි. | එකඟතාවයන් අනුව කටයුතු කල යුතුය. | ඉදිරියේදී මෙම පුහුණු වැඩ සටහන පැවැත්වීමට කටයුතු කරන බව |
| (ඊ)තාක්ෂණික ඇගයීම් කමිටු නිලධාරීන් විසින් විදේශියව සිදු කරන ලද භෞතික නිරීක්ෂණයෙන් අනතුරුව ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව ටර්න් කී මුද්‍රණ යන්ත්‍රයේ Wrapping Solution කොටස ප්‍රශ්න පත්‍ර වල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තුවට අත්‍යවශ්‍ය අංගයක් ලෙස නම් කර නිර්දේශ කර තිබුණු නමුත් මිලදී ගත් දින සිට රු.8,428,637 ක් වටිනා මෙම කොටස කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිශ්කාර්යව පැවතුණි. | දෙපාර්තමේන්තු අවශ්‍යතාවයට ගැලපෙන පරිදි මෙම යන්ත්‍ර කොටස වැඩි දියුණු කර භාවිතයට ගැනීමට කටයුතු කල යුතුය. | මෙම කොටස දැනට භාවිතා නොකරන බවත් දෙපාර්තමේන්තු අවශ්‍යතාවයට ගැලපෙන පරිදි මෙම කොටස සකස් කර ගැනීම සඳහා අදාල ආයතනය සමග සාකච්ඡා කරන බව |

## 3.4 කළමනාකරණ දූර්වලතා

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2009 දෙසැම්බර් 16 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු ඉ - රාජ්‍ය ප්‍රතිපත්ති 2010 මැයි 31 දිනැති අංක SP/SB/03/10 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය මගින් සියළුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඇතුළු රජයේ ආයතන අනුගමනය කල යුතු බව දන්වා තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව විසින් වෙබ් අඩවිය නිර්මාණය , මාර්ගගත ක්‍රමයට සහතිකපත් නිකුත් කිරීම හා ප්‍රතිඵල සනාථ කිරීම ඇතුළු ඉ - සේවාවන් සිදු කිරීමේදී ඉ - රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාරව තොරතුරු පද්ධතියට ප්‍රවේශ වීමට පෙර අනාවරණය නොකිරීමේ ගිවිසුම්වලට එළඹීම, සියළුම කාර්ය මණ්ඩලයට පුහුණුවීම් ලබා දීම, තොරතුරු තාක්ෂණය භාවිතය පිළිබඳ ප්‍රතිපත්තියක් සැකසීම, නියමිත වෙබ් ලිපිනය සංශෝධනය කිරීම සිදුකර නොතිබුණි. | තොරතුරු සම්බන්ධව සැපයුම්කරු විශ්වාසය කඩවන ආකාරයට කටයුතු කරන අවස්ථා වලදී නිතීමය ක්‍රියාමාර්ග ගැනීමට හැකිවන පරිදි අනාවරණය නොකිරීමේ ගිවිසුමකට එළඹිය යුතුය. එසේම ඉ - රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාරව කටයුතු කල යුතුය. | සැපයුම් ශාඛාව මගින් නව ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු යොදා ඇති බව හා සැපයුම්කාර සමාගම විශ්වාසය බිඳෙන ආකාරයේ කටයුත්තක මෙතෙක් නිරත වී නොමැත. ඉදිරියේදී දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ භාවිතය පිළිබඳ ප්‍රතිපත්තියක් සකස් කරන බවත් දෙපාර්තමේන්තුවේ අඩවි නාමය මුල් ලියාපදිංචි කිරීමේදී ඉ - රාජ්‍ය ප්‍රතිපත්තිය පලවී නොතිබුණු බවත් එම අවස්ථාවේදී www.doenets.lk යන වෙබ් අඩවි නාමය ලැබී ඇති බවත් මේ පිළිබඳ උපදෙස් අදාළ ආයතන වලින් ලබා ගැනීමට අපේක්ෂා කරන බවත් |
| (ආ)ආයතනික විභාග සඳහා මුදල් ප්‍රතිපාදනය කර ගන්නා ආකාරය පිළිබඳ නිශ්චිත ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් තීරණය කරගෙන නොතිබුණු බැවින් දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ වලින් අයවිය යුතු රු.27,388,031 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ආයතනික විභාග සඳහා මුදල් ප්‍රතිපාදනය කර ගන්නා ආකාරය පිළිබඳ නිශ්චිත ක්‍රමවේදයක් තීරණය කරගත යුතුය. | එකඟ වන බවත් අදාළ නිලධාරීන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බවත් |
| (ඇ) ආයතනික විභාග සඳහා ප්‍රශ්න පත්‍ර සකස් කරන සහ උත්තර පත්‍ර පරීක්ෂා කරන නිලධාරින් තෝරාගන්නා පදනම එම නිලධාරින්ට තිබිය යුතු | විවිධ කාලපරිච්ඡේද වලදී වෙනස් නොවන පරිදි ලිඛිත නිශ්චිත නිර්ණායක සකස් කරගත යුතුය. | සම්පත් පුද්ගලයන් ලෙස තෝරාගනු ලබන්නේ දීර්ඝ කාලයක් විශ්වාස වන්ත ලෙස කටයුතු කර ඇති විෂය ප්‍රවීණයින් වන අතර සම්පත් |

| | | |
|---|---|---|
| අධ්‍යාපන සුදුසුකම් , වෘත්තිය මට්ටම සහ පළපුරුද්ද දැක්වෙන ලිඛිත නිශ්චිත නිර්ණායක දෙපාර්තමේන්තුව විසින් සකස් කර නොතිබුණි. | | දායකයන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් දෙන අනුමැතිය සහිතව මෙම කටයුතු සඳහා යොදවා ගන්නා බව |
| (ඇ) අයදුම්කරුවන් සංඛ්‍යාව 2000 ට වැඩි විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා පරිගණක සහ ප්‍රතිඵල යන ශාඛා දෙකම සම්බන්ධ වී ලකුණු වෙනස්කම් තුලනය කර ගන්නා නමුත් 2000 ට අඩු අයදුම්කරුවන් පිරිසක් පෙනී සිටින විභාග වල ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා එවැනි ද්විත්ව පරීක්ෂණ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | 2000 ට අඩු අයදුම්කරුවන් පෙනී සිටින විභාග සඳහා ද පරිගණක සහ ප්‍රතිඵල ශාඛා දෙක සම්බන්ධ කර ද්විත්ව පරීක්ෂණ ක්‍රමවේදයකට අනුව ප්‍රතිඵල නිකුත් කිරීමට සැලසුම් කල යුතුය. | සියලුම ප්‍රතිඵල ලේඛන ප්‍රතිඵල ශාඛාවේ නිලධාරීන් විසින් පූර්ණ පරීක්ෂාවකට ලක් කරන බව |

## 4. මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපටිපාටික රීති සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව නිලධාරින් 08 දෙනෙකු වසර 18 ක් ඉක්මවා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව තිබුණි. | දෙපාර්තමේන්තුවට ගැලපෙන ස්ථාන මාරු ප්‍රතිපත්තියක් සකස් කර අනුමත කර ගැනීමට කටයුතු කල යුතුය. | එකඟ වන බව |